21/11/2010 - ඉරිදා ලංකාදීප

**ආකල්ප වෙනසක් තුළින් ආයෝජන නංවන සැලැස්මක් - මිලින්ද මොරගොඩ**

ශ්‍රී ලංකාවේ අය වැය ලේඛනය ගැන විවිධ අදහස් ඉදිරිපත් කර ඇත. අය වැය ලේඛනය ඉදිරිපත් කරන්නට පෙර හා ඉදිරිපත් කිරීමෙන් පසු නොයෙකුත් දෙනා නොයෙකුත් වාද විවාද පවත්වයි. එය සම්ප්‍රදායයක් වී තිබේ. විවෘත ආර්ථික ක්‍රමය මෙරටට හඳුන්වා දී දීර්ඝ කාලයක් ගතවී ඇත. එනමුත් මහජනතාව ඇතුළු මෙරට වැඩි දෙනෙකුගේ ආකල්ප තවමත් සංවෘත ආර්ථික පරිසරයක දී මෙනි. සංවෘත ආර්ථික පරිසරයකදී නම් අය වැය යෝජනා හා එහි ඇතුලත්විය හැකි ප්‍රතිසංස්කරණ යනාදිය ගැන ආයෝජකයන් මහත් අවධානයකින් සිටී. එනමුත් විවෘත ආර්ථික ක්‍රම පවතින රටවල අවස්ථාවෝචිතව තීන්දු ගන්නේ අයවැය ලේඛනයෙන් නොවේ. ජාත්‍යන්තර ආර්ථිකයේ පවතින ස්වභාවය, එහි තරඟකාරීත්වය හා මූල්‍ය වෙළඳ පොළේ ගමන්මග සලකා අවශ්‍ය අවස්ථාවන්හි දී නිසි තීරණ ගනී. අපට තවමත් එවැනි පරිසරයක් හුරු නැත. අප හුරු විය යුත්තේ අවශ්‍ය අවස්ථාවේ විශේෂඥ උපදෙස් පරිදි ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධ තීරණ ගනිමින් හා අයවැය මගින් රටට දර්ශනයක් ඉදිරිපත් කරන සම්ප්‍රදායකටය.

කෙසේ නමුත් ශ්‍රී ලංකාව පසු කළේ යුධ කාල පරිච්ඡේදයකි. අවුරුදු තිහකට නොඅඩු එම කාලයෙහි අලුතින් සිතා අලුත් දෙයක් කරන්නට ඉඩක් නොවීය. හැම විටම මුදල් වැය කරන්නට සිදුවූයේත්, ප්‍රමුඛ අවශ්‍යතාවය වී තිබුණෙත් යුද වියදම්ය. යුද්ධයට සම්බන්ධ අංශවල විනා පුලුල් ආයෝජන සිදුවූයේ ද නැත. ගැටුම්වලට මැදිවීමේ අවදානම හෙයින් ආයෝජකයන් ගේ උනන්දුවක් ද නොතිබිණ. ත්‍රස්තවාදී ගැටුම් පැවති අවස්ථාවල ආර්ථිකය සම්බන්ධයෙන් සොයා බලා තීරණගන්නට තිබුණ ඉඩකඩ අල්ප විය. ත්‍රස්තවාදය තුරන්කර සාමය තහවුරු කිරීමෙන් පසු මැතිවරණ කිහිපයක් පැවැත්විණ. ප්‍රජාතන්ත්‍රවාදය පවතින රටවල්වල මැතිවරණ සමය වනාහි වෙන්දේසි පවත්වන කාලයකි. දේශපාලන පක්ෂ ආණ්ඩු බලය දිනා ගැනීම වෙනුවෙන් නොයෙකුත් ඡන්ද පොරොන්දු හා ආකර්ශණීය සහන ප්‍රකාශයට පත් කරන අතර ආර්ථික වෘද්ධිය ගැන අවධානය නොදක්වයි. මේ යුග දෙක ම අවසන්ව තිබේ. දශක තුනක් වැනි දීර්ඝ කාලයකට පසු අනාගතය ගැන සිතන, ඒ වෙනුවෙන් වෙහෙසෙන අවස්ථාවක් උදා වී තිබේ. මේ නිසා 2011 වසර වෙනුවෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නට නියමිත අයවැය යෝජනා ගැඹුරු වැදගත්කමකින් යුක්තය.

සංවර්ධනය හා රටේ අනාගතය ගැන දේශපාලන පක්ෂ, බහුජන සංවිධාන ඇතුළු අප හැමදෙනාම උනන්දුවක් දක්වයි. අප හැම විටම පෙන්වා දී ඇත්තේ ආර්ථිකය දියුණු කරන්නට කෙටි හා සුවපහසු මාර්ග නැති බවය. ඒ වෙනුවෙන්  ඇත්තේ එක මාර්ගයකි. ජාත්‍යන්තර ප්‍රජාව ස්වකීය අත්දැකීම් වලින් තහවුරු කරන්නේ ඒ පණිවුඩයයි. කැපවීම හා නිසි අවස්ථාවේ නිවැරදි තීරණ ගැනීම එහිලා වැදගත්ය. ප්‍රතිසංස්කරණ අවශ්‍යය. ඕනෑම සමාජයක් පවතින තත්ත්වය වෙනස්කර යම් ප්‍රතිසංස්කරණයක් ඇතිවීම ගැන බලන්නේ සැකය හා අවිශ්වාසය ඇතිවය. සෘජු නායකත්වයක් අවශ්‍ය වන්නේ මහජනතාවට ඇත්ත තත්ත්වය තේරුම්කර ඔවුන්ට නොපෙනෙන අනාගතය පෙන්වා ඒ ගැන විශ්වාසයක් ඇතිකිරීමටය. මේ විශ්වාසය තුළින් රට දියුණු කරන්නට අවශ්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැගීම පහසුවෙයි. සමාජ එකඟතාවය හා යම් කැපවීමක් කිරීමෙන් අනතුරුව ජයග්‍රහණය කරා යා හැකි බවට පිළිගැනීමක් ඇතිවනු නිසැකය. ප්‍රජාතන්ත්‍රවාදී රාමුව තුළ ආර්ථිකය දියුණු කරන්නට තීරණ ගන්නා ආණ්ඩු වලට එහි ප්‍රතිඵල භුක්ති විඳින තෙක් බලය ආරක්ෂා කරගන්නට අවස්ථාව නොලැබේ. අම්හිරි, තද තීරණ ගන්නාවිට මහජනතාව අතර ජනප්‍රිය වන්නේ නැත. එවිට ඡන්දයෙන් පරාජයට පත්වෙයි. පරාජයට පත් ආණ්ඩුව ගත් තීරණවල ප්‍රතිලාභ ලැබෙන්නේ ඉන් අනතුරුව බලයට පත්වන රජයටයි. යුද්ධය දිනූ නායකයන්ට රට දියුණු කිරීමේ අවස්ථාව අහිමි විය. ආර්ථික අර්බුදවලට මුහුණ පා නිවැරදි දැක්මක් ඇතිව ක්‍රියාකිරීමෙන් යළි රටවල් යහමගට ගත් නායකයෝ බලයෙන් පහවී ඇත. නමුත් මහින්ද රාජපක්ෂ ජනාධිපති තුමන්ට මෙම ඉතිහාසය අලුත් කරන්නටත්, යුද්ධය දිනා ආර්ථිකය නව මාවතකට අවතීර්ණ කරන්නටත් අවස්ථාව උදා වී තිබේ.

සෞභාග්‍යය උදෙසා ශ්‍රී ලංකාවට හුදෙකලාව ගමන් කළ හැකි මගක් නැත. කුඩා ජනගහනයක් ඇති කුඩා රටක් වශයෙන් සුවිශාල ලෝකය හමුවේ අපට වෙනස් මගක් අනුගමනය කළ නොහැකිය. ජාත්‍යන්තරය ගමන් කරන දර්ශනයට අනුව එයට සමාන්තරව ගමන්කළ කුඩා රටවල් අද ශ්‍රී ලංකාවට වඩා ආර්ථික හා සමාජයීය වශයෙන් පැහැදිලි දියුණුවක් ලබා තිබේ. ආර්ථික ක්‍රමය අනුගමනය කරන

ප්‍රතිපත්ති ගැන අවුරුදු ගණන් සාකච්ඡා කර ලබාගත් අත්දැකීම් අපට තිබේ. නිදහස ලබාගත් අවස්ථාවේ සිට මේ දක්වා අත්හදා බැලීම් කර ඇත. වාද විවාද හා මතගැටුම් ඇති කරගෙන තිබේ. දෙවන ලෝක යුද්ධය අවසන් වන විට ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් හා දියුණු මට්ටමක පැවතිණ. එනමුත් එය අඛණ්ඩ වර්ධනයක් දක්වා පවත්වාගෙන යන්නට අප අපොහොසත් විය. එයට බලපෑවේ ප්‍රතිපත්ති ප්‍රශ්න හා දේශපාලන තීරණය. එනමුත් ජාත්‍යන්තරය දෙස බලනවිට ආර්ථිකය සකස් කරන්නට අද ඇත්තේ ලෝකයේ විශාල හා කුඩා රටවල් බහුතරයක් පිළිගෙන ඇති එකම ක්‍රමයක් බව තේරුම් ගැනීම වැදගත්ය. ප්‍රායෝගිකව ක්‍රියාත්මකවීමේ දී ආර්ථික දර්ශනයේ සුළු වෙනස්කම් දැකිය හැකි නමුත් එහි රාමුව නොඑසේනම් හරය ශක්තිමත් වැඩිදෙනෙකු අනුගමනය කරන එකකි. චීනය, දකුණු කොරියාව හා කියුබාව මෑත භාගය තුළ අවස්ථාව අනුව ස්වකීය ගමන් මග යළි වෙනස් කර ගත් රටවල් කිහිපයකි. විවෘත ආර්ථික ක්‍රමයක් එක දිගට පවතින්නේ නැත. එහි සීඝ්‍ර වර්ධන, පසුබෑම් හා අඩාලවීම් මුණ ගැසේ. ඒවා නිවැරදි කිරීමට ගන්නා පියවර ඔස්සේ ආර්ථිකය අලුත් ජවයකින් නැගීසිටියි. මෑත භාගය තුළ බටහිර රටවල ආර්ථිකයේ ප්‍රශ්න හටගැණුනි. අවශ්‍ය ප්‍රතිසංස්කරණ හමුවේ ආර්ථිකය වර්ධනය වෙමින් තිබේ. ඇමරිකාව, ආර්ථික අර්බුදයක් හමුවේ හදවතක් නැති ආකාරයට මුහුණ දෙන රටකි. අනතුරින් මිදීම සඳහා ඉක්මන් තීරණ ගන්නා අතර සහන සීමාකර ආයතන වසා දමා සේවකයන් වන්දි නොගෙවා විශාල වශයෙන් රැකියා වලින් ඉවත් කරයි. එවට සමාජයට ප්‍රශ්නයක් ඇති බව දැනෙන අතර තරඟකාරීව වඩා උද්යෝගයෙන් වැඩ කරන්නට පෙළැඹෙයි. නව සොයාගැනීම් කරයි. වියදම් අඩුවන අන්දමට කාර්යක්ෂම වෙයි. ඵලදායීතාව වර්ධනය වෙයි. දැන් බ්‍රිතාන්‍යයේ සිදුවෙමින් පවතින්නේත් එයයි. රජයේ වියදම් විශාල වශයෙන් අඩුකර ඇති අතර සහන සීමා කර තිබේ. ආසියානු රටවල් මහජනතාවට පීඩාවක් වෙන්නට ඉඩ නොදී තමන් රජය එහි අවාසි දරා ගන්නා අතර ඒ නිසාම මහජනතාවට ආර්ථිකයේ වැටීම් හා අභියෝග ගැන අවබෝධයක් නැත.

දැනට අවධානයට ලක්ව ඇති අන්දමට මේ උදා වී ඇත්තේ ආසියාවේ යුගයයි. ආසියානු කලාපයේ රටවල ආර්ථිකය වේගයෙන් ඉදිරියට යාහැකි බව ජගත් නිරීක්ෂකයන්ගේ අදහසයි. ඉන්දියාව හා චීනය එහි පෙරමුණ ගෙන තිබේ. ඉන්දියාවේ ආර්ථික වර්ධනය සියයට නමයකි. චෙන්නයි ප්‍රාන්තයේ මෝටර් රථ කර්මාන්තය දියුණු වී ඇත. ලෝකයේ සියලුම ප්‍රධාන පෙළේ මෝටර්රථ නිෂ්පාදනායතන මෙහි ව්‍යාපාර අරඹා තිබේ. අතීතයේ මෙවැනි පිබිදීමක් තිබුණේ ඇමරිකාවේ ඩිට්‍රොයිට් ප්‍රදේශයේය. මෙම වාහන නිපදවන කර්මාන්තශාලා වෙනුවෙන් අවශ්‍ය එක උපාංගයක් ශ්‍රී ලංකාවේ නිපදවා අපනයනය කරන ගිවිසුමකට එකතුවිය හැකි නම් ශ්‍රී ලංකාවේ දැන් ඇති රැකියා හිඟය සම්පූර්ණයෙන්ම අවසන්කළ හැකිය. මේවා බලවත් හා සිතාගත නොහැකි තරම් විශාල ආයෝජනය. එපමණක් නොවේ, ප්‍රායෝගිකව සලකා බැලුවහොත් මෙරට භාණ්ඩ ප්‍රවාහන නැව් වලින් සියයට හැත්තෑවක් ඉන්දියාවේ වරාය සමග සම්බන්ධය. අසල්වැසි රටක් වශයෙන් ඉන්දියාව තම ආර්ථික සැලැස්ම සකස්කර කලාපයේ රටවල් කිහිපයක් සමග ගිවිසුම් අත්සන් කළේය. ශ්‍රී ලංකාව අත්සන් කළ සීපා ගිවිසුම එයින් එකකි. මෙවැනි අවස්ථා සමග එකතු වන්නට තීරණය කළහොත් ශ්‍රී ලංකාවට අනාගත සංවර්ධනය ගැන බලාපොරොත්තු තැබිය හැකිය.

අය වැය ලේඛනය ඉදිරිපත් කරන මෙම අවස්ථාවේ රජය ප්‍රධාන වශයෙන් කරුණු කිහිපයක් ගැන අවධානය යොමු කළ යුතුය. දේශීය හා විදේශීය ආයෝජකයන්ට ඉඩ දීම, අය වැය හිඟය අඩු කරගැනීම සහ ආර්ථිකයේ තරඟකාරීත්වය ඇතිකර හා ඵලදායීතාව වර්ධනය එහිලා ප්‍රධානය. මෙවැනි අවශ්‍යම කරුණු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමු නොකළහොත් සිදුවන්නේ ආදායම හා වියදම අතර පරතරය පියවා ගැනීම උදෙසා දේශීයව හා විදේශීයව ණය ගැනීමට සිදුවෙයි. දේශීයව ණය වැඩිවීම සෘජුවම උද්ධමනයට බලපායි. විදේශීය ණය ගැනීම එක පැත්තකින් රටේ විදේශීය ආදායම ණය හා පොලිය ආපසු ගෙවන්නට වැය කිරීමකි. අනෙක් පැත්තෙන් ශ්‍රී ලංකාව ෆ්‍රීන් දුගී බවින් මිදී මැදි ආදායම් රටක් වශයෙන් පත්ව තිබීම හෙයින් ණය හා ආධාර ලබා ගැනීමේ දී ජාත්‍යන්තර ප්‍රජාවගෙන් විශේෂ සහන නොලැබේ. ඉදිරිපත් කරන ව්‍යාපෘති වෙනුවෙන් සාමාන්‍ය වශයෙන් ණය ගන්නට සිදුවෙයි. මෙම බැඳුම්කර වෙනුවෙන් ණය දෙන ආයතන, ණය ආපසු ගෙවීමට ඇති හැකියාව හා ඒ වෙනුවෙන් රට තුළ පවතින ශක්තිය ගැන නිතර උනන්දුවෙයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මෙන් නොව මෙවැනි ආයතන වල සුපරීක්ෂාකාරීවීම නිසා ණය ලබා ගත නොහැකි වුවහොත් එය මෙරට ආර්ථිකයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ප්‍රශ්නයකි. ගන්නා ණය යහපත් අන්දමට කළමනාකරණය කර උපරිමව ප්‍රයෝජනයට නොගතහොත් ගෙවන පොලිය අපරාධයකි.

රටක් වශයෙන් සංවර්ධනය අරභයා ඉලක්කයක් තිබිය යුතුය. ත්‍රස්තවාදය අවසන් කිරීම එකම අභිලාශය වශයෙන් පැවති කාලපරිච්ඡේදය තුළ සංවර්ධන ගමන ගැන වඩා පුලුල් අවධානයක් නොතිබිණ. වසර 2015 වන විට දැනට පවතින ඒක පුද්ගල ආදායම දෙගුණයක් දක්වා වර්ධනය කරගත යුතුය. එම ඉලක්කය සාර්ථක කරගතහොත් පමණක් රැකියා හිඟය, ආදායම් විෂමතා හා දුප්පත්කම නැති සමාජයක් ගැන බලාපොරොත්තු තැබිය හැකිය. වැටුප් වැඩි කිරීමෙන් හෝ වැඩි වැඩියෙන් රජයේ රැකියා සැපයීමෙන් ඒක පුද්ගල ආදායම ඉහල යන්නේ නැත. තව තවත් ආයෝජන වැඩිකර ආදායම් ඉපැයීමේ අවස්ථා ඉහළ නැංවීම එයට ඇති එකම මඟයි. පර්යේෂණ වාර්තා අනුව දැනට පවතින ඒක පුද්ගල ආදායම දෙගුණයක් තෙක් වැඩි කරන සංවර්ධන වේගයක් ලබා ගැනීමට නම් ආයෝජනය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට හතලිහක් වත් විය යුතුය. පසුගිය වසර පහක පමණ කාලය තුළ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් මෙරට ආයෝජන සියයට 27 නොඉක්මවීය. 2010 වසරේ එය සියයට 25 කි. පවතින ආයෝජන වලින් සියයට 6-7 අතර කොටසක් රජයේ ආයෝජනය. සියයට 20 ක් පමණ ප්‍රතිශතයක් ආයෝජනය කර ඇත්තේ පුද්ගලික අංශයයි. පුද්ගලික අංශයේ ආයෝජන වලින් සියයට එකක් පමණ විදේශීය ආයෝජන බව දත්ත පෙන්නුම් කරයි. සියයට දහය ඉක්මවන ආර්ථික වර්ධනයක් ළඟාකරගෙන ඒක පුද්ගල ආදායම දෙගුණයකින් වැඩි අවස්ථාවක් කරා යා හැකි වන්නේ විදේශීය ආයෝජන සියයට පහ දක්වා හා පුද්ගලික අංශයේ ආයෝජන ප්‍රතිශතය තවත් සියයට දහයකින්වත් වැඩි කර ගත හොත් පමණකි. රජයට පමණක් මේ පරතරය පියවන්නට ආයෝජන කිරීම අපහසුය. අතිවිශාල ධනයක් ණයට ගෙන අලුත් ආයෝජන කරමින් අවදානමකට උර දෙනවාට වඩා විදේශ ආයෝජන හා පෞද්ගලික අංශයේ ආයෝජන දිරිමත් කිරීම සුදුසුය.

මහජනතාවට සහන දෙමින්, විශාල රාජ්‍ය සේවයක් පවත්වාගෙන යමින් හා වැඩි වැටුප් හා දීමනා සපයන අතර ආයෝජනයට අවශ්‍ය අරමුදල් සපයා ගන්නට ආණ්ඩුවට හැකිද? මුදල් සොයාගත හැක්කේ ණය ගැනීමෙන් හෝ බදු වැඩි කිරීමෙන් පමණකි. බදු වැඩි කරන තීරණ ගන්නට අය වැය යෝජනා අවශ්‍ය නැත. ආණ්ඩුවට අවශ්‍ය ඕනෑම මොහොතක බදු සංශෝධනය කළ හැකිවේ. සංවර්ධන අවශ්‍යතා වෙනුවෙන් බදු වැඩිකළ යුතු බව රජය ප්‍රකාශයට පත් කළහොත් මහජනතාව එයට දක්වන ප්‍රතිචාරය යහපත් එකක් නොවේ. මහජනතාව දැනටමත් ඍජු හා වක්‍ර අන්දමින් විශාල වශයෙන් බදු ගෙවයි. අත්‍යවශ්‍ය භාණ්ඩ හා එදිනෙදා ගනුදෙනු වලදී අයකරන බදු වැය කරන්නට සිදුව ඇත්තේ රජයේ යාන්ත්‍රණය පවත්වාගෙන යන්නට හා පොහොර, සමෘද්ධි සහන, සෞඛ්‍ය සේවා, අධ්‍යාපනය ඇතුලු මහජනතාවට දැනෙන අංශ වෙනුවෙන් රජයට විශාල බරක් දරන්නට සිදුව තිබේ. එය සීමා කළ නොහැකි, යම් කපා හැරීමක් සිදුවුවහොත් විශාල ජනතා විරෝධයක් මතුවන අංශ බව අමතක කළ යුතු නැත. මේ නිසා ආණ්ඩුවට ආයෝජන වෙනුවෙන් මුදල් සපයා ගන්නට ඇති අවස්ථා සීමිත බව පැහැදිලිව අවබෝධ කර ගැනීම කර ගත යුතුය.

මේ අනුව ආණ්ඩුවට ගත හැකි පියවර ඉතා සීමිතය. පළමුවෙන් පැහැදිලිවම රජය ස්වකීය වියදම් අඩු කර ගත යුතුය. වියදම් අඩු කිරීමේ තීරණය සමග අය වැය හිඟය පාලනය කර ගත හැකිවෙයි. 2009 අවුරුද්දේ අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට නමයක් පමණ විය. මේ ගෙවී යන වසරේ එය හැකිතාක් අරපරෙස්සමෙන් ආදායම් හා වියදම් පාලනය කරගතහොත් සියයට අටකට ගෙන ආ හැකි වෙයි. 2011 වසරේ අයවැය හිඟය සියයට හතක සීමා දක්වා අඩු කරන අතර සංවර්ධනය උදෙසා ආයෝජන වැඩි කිරීමට උපරිමයෙන් ක්‍රියා කිරීම වැදගත්ය. ඒ සමගම විනිමය අනුපාතිකය ගැනද සමබරව තීන්දු ගැනීම වැදගත්ය. රුපියලේ අගය ශක්තිමත්වන විට අපනයන වලට එය බලපායි. අපනයන ඉල්ලුම අඩුවන විට එය මෙරට විදේශ සම්පත් පිරිහීමට හේතුවක් වෙයි. චීනය, දකුණු කොරියාව වැනි රටවල් ස්වකීය විදේශ වෙළඳාම දියුණු කරගත්තේ විනිමය අනුපාතිකය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමෙනි. දෙවනුව දේශීය, පුද්ගලික අංශයේ හා විදේශීය ආයෝජන වෙනුවෙන් පහසුකම් දිය යුතුවෙයි. පහසුකම් යනුවෙන් මෙම ආයෝජකයන්ට බදු සහන හෝ දිරි දීමනා ලබා දිය යුතුයැයි ඍජුව අදහස් නොකෙරේ. ප්‍රතිපත්ති සම්පාදනයේ දී ආයෝජකයන්ට බාධා නොවන අයුරින් ක්‍රියා කිරීම වැදගත්ය. මේ දිනවල සංචාරක ව්‍යාපාරයේ පිබිදීමක් ඇත. දකුණේ ඈත නගරයක හෝ උතුරේ නගරයක ව්‍යවසායකයෙකු සංචාරකයෙකු වෙනුවෙන් ව්‍යාපාරයක් අරඹන්නට අදහස් කළහොත් ඒ වෙනුවෙන් අවසර ගන්නට කොළඹට පැමිණිය යුතුය. වරක් දෙවරක් නොවේ. ඔහුට තම ව්‍යාපාරය එපා වෙන තරමට එහි කොන්දේසි හා අවසර ගත යුතු අවස්ථා ඇත. මේ වෙනුවෙන් වැය කරන කාලය හා ධනය මුදල් හා

ව්‍යවසායක අභිප්‍රාය ඇති ඕනෑම ව්‍යවසායකයෙකු අධෛර්යයට පත් කරයි. අවසර ගත යුතු ආයතන ප්‍රාදේශීය, පළාත් හා ජාතික මට්ටමින් ඇති අතර ඒ වෙනුවෙන් වෙහෙසෙන විට ව්‍යාපාරයේ දියුණුව හා එය පවත්වාගෙන යාමට වෙහෙසෙන අතර නොයෙකුත් අන්දමින් බදු ගෙවන්නටත් නිලධාරීන්ගේ බලපෑම්වලට යටත් වන්නටත් සිදුවන විට අලුත් ව්‍යවසාය බිහි නොවේ. පුද්ගලික අංශයේ ආයෝජන වැඩි කළ යුතුය යනුවෙන් මුළින් සඳහන් කළේ මෙවැනි කුඩා පරිමාන ව්‍යවසාය කෙරෙහි වැඩි බරක් දක්වමිනි. ඇමරිකාවේ ව්‍යාපාර අතිරින් සියයට අසූවක් පමණ කුඩා පරිමාන ව්‍යවසායයන්ය. ජපානයේ, චීනයේ හෝ තායිලන්තයේ ආර්ථිකයට පිබිදීමක් ඇති කරන්නේ දැවැන්ත ව්‍යාපාර වලට සමානව ක්‍රියාශීලී කුඩා ව්‍යාපාර ජාල බව අමතක කළ යුතු නැත.

තෙවනුව සියලුම ව්‍යාපාර, නිෂ්පාදන හා සේවා අංශවල තරඟකාරීත්වයක් හා පලදායකතාවයේ වැඩිවීමක් අපේක්ෂා කළ යුතුය. මෙරට රජයේ හා පුද්ගලික අංශයේ විශාල පසුබෑමකට හේතු වී ඇත්තේ තරඟකාරීත්වයක් නැති වීමයි. නිෂ්පාදන වියදම අඩුකර වැඩි කාලයකින්, අඩු වෙහෙසකින් වැඩි නිපැයුමක් කළ හැකි නම් වෙළඳ පොළේ දී එම නිපැයුම් වල මිළ අඩු වෙයි. කෘෂිකර්මයේ දී මේ බව සනාථවෙයි. සහල්, අර්තාපල් හෝ ලොකු ලූනු මෙරට නිපදවනවාට වඩා ආනයනය කිරීම වාසිදායකය. මෙරට ගොවීන්ට පොහොර සහනාධාර දී සහල් කිලෝවක් නිපදවන්නට වැය කරන මුදලට වඩා විශාල මිළක් අඩුවෙන් ඉන්දුනීසියාවෙන් හෝ තායිලන්තයෙන් සහල් ආනයනය කළ හැකිය. අර්තාපල් ඇමරිකාවෙන් ගෙන්වා අද වෙළඳපොළේ පවතින මිළට වඩා හරි අඩක් අඩු මිළකකට පාරිභොගිකයන්ට අලෙවි කළ හැකිවේ. ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ ඇති නොවෙනස් සාම්ප්‍රදායික ලක්ෂණ හා මුහුද ප්‍රයෝජනයට නොගැනීම හෙයින් මාලු මිළ ගණන් වැඩි අතර අසල්වැසි රටවල් පවා මෙරට මුහුදේ මත්‍ය අස්වැන්න අත්පත් කර ගනී. ධීවර කර්මාන්තය දියුණු රටකින අඩු මිළට මාලු ආනයනය කර මෙරට මහජනතාවට අළෙවි කළ හැකිය. මෙවැනි වාතාවරණයකට හේතුව කාර්යකෂමතාවයක් නොතිබීමයි. තරඟකාරීත්වය හා පලදායකත්වය ගැන නොසිතා ව්‍යවසාය පවත්වාගෙන යාමයි. ඒ වෙනුවෙන් ගෙවන වැඩි මිළ රටට මහජනතාවට විශාල බාධාවකි. අඩුම තරමින් ගොවියන් වගා කරන එළවලු සහ පළතුරු ගොවියාගේ සිට පාරිභෝගිකයා අතට එන විට සිදුවන නාස්තිය හා අතරමැදි වෙළඳාම අඩු කළ හැකිනම් මෙරට එළවලු හා පළතුරු මිළ ඉතා අඩු බව ප්‍රතිපත්ති සම්පාදකයන් තේරුම් ගත යුතුය.

අය වැය මගින් අවධානය යොමු කළ යුත්තේ මෙවැනි මූලික කාරණා සම්බන්ධවය. ආදායම ගණන් බලා අවුරුද්දේ වියදම සොයා ඒ අතර පරතරයක් ඇති හෙයින් බදු පනවන්නට අයවැයක් අවශ්‍ය නැත. ශ්‍රී ලංකාවේ අයවැය ලේඛනය ඉදිරිපත් කරන්නට කලින් ඕනෑම අවස්ථාවක රට තුළ ආදායම හා වියදම ගණන් බලා අවශ්‍ය බදු සංශෝධන කරන්නට ඉඩ කඩ තිබෙන අතර එවැනි සංශෝධන කළ බවට උදාහරණ උවමනා තරම් තිබේ. රටට අවශ්‍ය දර්ශනය තෝරාගෙන ආයෝජන වැඩිකරන අරමුණ ඇති අයවැය ලේඛනයක් ඉදිරිපත් කිරීම කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමුකළ යුතුවෙයි. යුද්ධය අවසන් හෙයින් හැමදෙනෙකුම බලාපොරොත්තුවන්නේ අයිතිවාසිකම්ය. අයිතිවාසිකම් සමග රට ගොඩනගන්නට කෙටි කාලයක් ස්වකීය යුතුකම් ඉටුකළයුතු බව ද මහජනතාව තේරුම්ගත යුතුය. රජය ත්‍රස්තවාදය පරාජය කළේ මහජනතාව එකතු වී ස්වකීය සම්පූර්ණ සහායදුන් හෙයිනි. කැපවී සියලු දුක්කරදර විඳදරා ගනිමින් ඒකායන අරමුණකින් ක්‍රියාකළ බැවිනි. කැපවීමකින් හා පරිත්‍යාගයකින් තොරව ආර්ථික දියුණුව ද ලඟා කරගතහැකි නොහැකිය.

වර්තමානයේ රජයේ සේවකයන්ගේ සිට වැඩකරන ජනතාව හැම කෙනෙකුම සහන අපේක්ෂා කරයි. ආණ්ඩුවට සහන දිය හැක්කේ මහජනතාවගෙන් අයකරගන්නා බදු වලිනි. ලැබෙන බදු ප්‍රමාණය සීමිතනම් එයින් ඉටුකළහැකි බලාපොරොත්තු සීමිතය. අපේක්ෂාභංගවන ජනතාව යළි ආණ්ඩුව කෙරෙහි කනස්සල්ලට පත්වෙයි. ආණ්ඩු පෙරලීම වෙනත් පක්ෂයකට සහාය දුන්නානම් හොඳයි යනුවෙන් කල්පනා කිරීම සාමාන්‍ය සිද්ධියකි. අය වැය රාමුව නිසි ලෙස සකස්කර ආයෝජන වැඩිකර ගතහොත් මේ චක්‍රයෙන් මිදී දියුණුව කරා යා හැකිය. ඉදිරි වසර කිහිපය තුළ ඒක පුද්ගල ආදායම දෙගුණ කරන ඉලක්කය උදෙසා නිසි තීරණ නොගතහොත් යළි පැරණි රාමුව තුළ මහජනතාව කොටුවීම වැලැක්විය නොහැකිය. එහි ඇත්තේ අපේක්ෂාභංගත්වයයි, ආණ්ඩුව කෙරෙහි කළකිරුණ හා අසහනකාරී හැඟීමයි. ජීවන වියදම වැඩිබව කියමින් නගන උද්ඝෝෂණ හා වැඩවර්ජනයි. ඒ පසුපස හඹා එන තර්ජනය හා මර්දනයයි. යුධ කාලපරිච්ඡේදයෙන් පසු නිර්භීත හා නිවැරදි තීන්දු මගින් අනාගතය තීරණය කිරීමේ අවස්ථාව 2011 අයවැය සමග උදා වනු ඇත.